සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

පෙරහුරු පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2022
Practice Test - Grade 13 - 2022

නර්තනය (දේශීය) I 52 S I

කාලය: පැය දෙකයි

විභාග අංකය: ..............................................

උපදෙස් :-

* ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම සැපයිය යුතු ය.
* එක් ප්‍රශ්නයටක ම ලකුණු 02 බැගින් මුළු ලකුණු 100 කි.

- 1 සිට 25 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේදී නිවැරැදී හෝ ගැළපෙන හෝ පිළිතුර තෝරා ඊට අදාළ අංකය ප්‍රශ්නය ඉදිරියෙ හි ඇති වරහන තුළ ලියන්න.

01. පිළිවෙලින් මෝල්ගස් නැටුම, පතුරු නැටුම හා ගොයම් යන ගැමි නැටුම් වේදිකාවට සුදුසු පරිදි නිර්මාණය කරන ලද්දේ,
   1. එස් පණිභාරත, ජයසේන කෝට්ටගොඩ, මිරැන්ඩා හේමලතා
   2. මිරැන්ඩා හේමලතා, පියසාර ශිල්පාධිපති, එස් පණිභාරත
   3. මුදියන්සේ දිසානායක, මිරැන්ඩා හේමලතා, එස් පණිභාරත
   4. පියසාර ශිල්පාධිපති, මිරැන්ඩා හේමලතා, චිත්‍රසේන
   5. මිරැන්ඩා හේමලතා, ජයසේන කෝට්ටගොඩ, විල්සන් ඔලබොඩුව (..............)

02. ''දළ ගජ මන්නවා දෙවියන් අතින් කපවා .................'' මෙම කවි පදයෙන් කියවෙන්නේ,
   1. ගැට බෙරෙයේ උපත පිළිබඳව
   2. රබානේ උපත පිළිබඳව
   3. උඩැක්කිය උපත පිළිබඳව
   4. තම්මැට්ටම් උපත පිළීබඳව
   5. දවුලේ උපත පිළිබඳව (..............)

03. රති, ක්‍රෝධ, ජුගුප්සා යන භාවයන් උපදින රසයන් අනුපිළිවෙල වන්නේ,
   1. භයානක රසය, වීරරසය, හා අද්භූත රසය වේ.
   2. වීර රසය, රෞද්‍ර රසය, හා අද්භූත රසය වේ.
   3. වීර රසය, රෞද්‍ර රසය, බිභත්ස්‍ය රසය වේ.
   4. ශෘංගාර රසය, රෞද්‍ර රසය, බිභත්ස්‍ය රසය වේ.
   5. හස්‍ය රසය, රෞද්‍ර රසය හා බිභත්ස්‍ය රසය වේ. (..............)

04. පිළිවෙලින් උඩරට පහතරට සබරගමු වන්නම් වන්නේ,
   1. මයුරා, එක් තාලය හා නාග ගජගා වේ.
   2. සැවුලා දෙතලාය හා කදම්භ පක්ෂි වේ.
   3. කිරළා, ලලිතරාග තාලය හා හනුමා වේ.
   4. ගාහක, නළුගීතිකා තාලය, හා තිසරා වේ.
   5. කොවුලා ග්‍රහ දණ්ඩ තාලය හා කිරළා වේ. (..............)

05. ''අනේ මී මැස්සේ මල් රොන් ගෙනයන රිස්සේ'' මෙම කවියට සම්ප්‍රදායානුකූලව ගයනු ලබන තිත් රූපය තෝරන්න.

1. 1 2/ 1 2 3 2. 1 2 3 4/ 1 2 3 4 3. 1 2 3/ 1 2 3 4
4. 1 2/ 1 2 5. 1 2 3/ 1 2 3 (............)

06. සැස්සේරුව කොරවක්ගල හා පාලමොට්ටායි සෙල් ලිපි අයත් වන්නේ පිළිවෙලින් කුමන යුග වලටද?

1. පොළොන්නරු හා අනුරාධපුර 2. ගම්පොල හා පොළොන්නරුව
3. කෝට්ටේ හා මහනුවර 4. අනුරාධපුර හා පොළොන්නරුව
5. මහනුවර හා අනුරාධපුර (............)

07. සමනල වන්නම හා හංස වන්නම යන වන්නම් නිර්මාණයේ දී ප්‍රථමවරට රංගනයෙන් දායක වී ඇත්තේ පිළිවෙලින්,

1. නිත්තවෙල ගුණයා හා ප්‍රේමකුමාර එපිටවෙල ය.
2. ප්‍රේමකුමාර එපිටවෙල හා මුදියන්සේ දිසානායක ය.
3. ආරියරත්න කළුආරච්චි හා ප්‍රේමකුමාර එපිටවෙල ය.
4. නිත්තවෙල ගුණය හා මුදියන්සේ දිසානායක ය.
5. ප්‍රේමකුමාර එපිටවෙල හා නිත්තවෙල ගුණයා ය. (............)

08. ''ගැමි නාටක ප්‍රවේශය'' හා ''වේදිකා නාට්‍යයේ අනුශංගික කලා'' යන කෘතීන් රචනා කරන ලද්දේ,

1. එදිරවීර සරච්චන්ද්‍ර හා ලයනල් බෙන්තරගේ
2. මුදියන්සේ දිසානායක හා ජගත් පද්මසිරි
3. ජගත් පත්මසිරි හා ජයලාල් රෝහණ
4. ලයනල් බෙන්තරගේ හා ජයලාල් රෝහණ
5. ජයසේන කෝට්ටගොඩ හා ජගත් පද්මසිරි (............)

09. මාත්‍රා 3 + 4 තාල රූපයට සමාන හින්දු ස්ථානි තාලය වන්නේ,

1. දාදරා තාලයයි 2. කෙහෙර්වා තාලයයි 3. ඣප් තාලයයි
4. ත්‍රි තාලයයි. 5. දීප් චන්දි තාලයයි. (............)

10. ''අසව් අසව් තනවා ගනිමින් මහරු....'' මෙම කවිය අයත් වන්නේ,

1. නානුමුරයටය. 2. කොහොඹා හැල්ලටය. 3. සිරසපාද වලටය.
4. ග්‍රහපන්ති වලටය. 5. මඩු පුරයටය. (............)

11. සුරත්තට්ටුව, මණ්ඩම හා සවරම යොදා ගනු ලබන්නේ පිළිවෙලින්,

1. ගැටබෙරය, පහතරට, බෙරය, උඩැක්කිය
2. ගැටබෙරය, තම්මැට්ටම, උඩැක්කිය 3. දෙවොල් බෙරය, තබ්ලාව, දවුල
4. ගැටබෙරය, තම්මැට්ටම, රබාන 5. දවුල, තම්මැට්ටම, උඩැක්කිය
(............)

12. මුදුන් මාල තොරණ, වට කුමාර විදිය, මල් බුලත් පුට්ටුව ආදී සැරසිලි දක්නට ලැබෙන ශාන්ති කර්ම වන්නේ,

1. රට යකුම හා පහන්මඩුව ශාන්තිකර්ම වල ය. 2. පහන්මඩුව හා බලි ශාන්තිකර්ම වල ය.
3. පහන්මඩුව හා රිද්දියාගය ශාන්තිකර්ම වල ය. 4. රිද්දියාගය හා බලි ශාන්තිකර්මවල ය.
5. දෙවොල් මඩුව හා බලි ශාන්තිකර්මවල ය. (............)

13. කිරිමඩුව හා වලියක්, මංගල්‍යයට ආවේණික චාරිත්‍ර ලෙස සැලකෙන්නේ පිළිවෙලින්,
    1. කාලි යෑම හා ගරායක් නැටීම.
    2. කීල බැඳීම හා මල නැටීම.
    3. කහ රොටී පිදීම හා පරහඳ ගෑම
    4. පරහඳ ගෑම හා කාලි යෑම.
    5. පඬුරු ගැට ගැසීම හා කීළ බැඳීම (............)

14. බලි ශන්ති කර්මය බ්‍රාහ්මණ යාගවලින් මිදි බෞද්ධ මුහුණුවරකට යොමු කිරීම සඳහා පුරෝගාමී වූයේ,
    1. තොටගමුවේ ශ්‍රී රාහුල හිමි.
    2. නිශ්ශංක මල්ල රජු ය.
    3. මහා පරාක්‍රම බාහු රජුය.
    4. රාමචන්ද්‍ර බමුණා ය.
    5. විදාගම මෛත්‍රී හිමිය. (............)

15. විභව අනුභාව ව්‍යාභිචාරී භාව සංයෝගයෙන් රස නිෂ්පත්තිය සිදුවන බව පවසා ඇත්තේ,
    1. භරත මුණි ය.
    2. ඇරිස්ටෝටල්ය.
    3. ආනන්ද වර්ධන ය.
    4. නන්දි කේෂවර ය.
    5. සාරංග දේව ය. (............)

16. කාන්තා ලෙඩ රොග නිවාරණය සඳහාම වෙන් වූ පිළිවෙලින් උඩරට, පහතරට, හා සබරගමු සම්ප්‍රදායන්ට අයත් ශාන්ති කර්ම වන්නේ,
    1. කොහොඹ කංකාරිය, රටයකුම හා කිරිමඩුව යි.
    2. කඩවර කංකාරිය, රිද්දියාගය හා කුමාර සමයම යි.
    3. වලියක් මංගල්‍යය, කුමාර සමයම හා රිද්දියාගය යි.
    4. කඩවර කංකාරිය, රට යකුම හා කිරිමඩුව ය.
    5. කොහොඹ කංකාරිය, දෙවොල් මඩුව හා සන්නියකුම යි. (............)

17. කථක් නර්තනාංගය සඳහා භාවිත කන්තෝඩු සහ අත්බාහු පළඳනා වන්නේ,
    1. ලෙහෙඟා සහ ජිම්ක්කි ය.
    2. කරණ්ඩූල් සහ බාසුබන්ධි ය.
    3. ගුංගුරු සහ මාට්ටල් ය.
    4. කරණ්ඩූල් සහ ජිම්ක්කි ය.
    5. මාට්ටල් සහ කරණ්ඩූල් ය. (............)

18. ශාන්තිකර්මවලදී වෙස් මුහුණු භාවිතා නොකරන අංගරචනා ක්‍රමවේද භාවිත චරිත ලෙස සැලකෙන්නේ,
    1. ලිච්ඡවී හා ගොළු සන්නිය
    2. රීරි යකා සහ මරු සන්නිය
    3. වඩිග පටුන සහ කෝළ සන්නිය
    4. රීරි යකා සහ ලිච්චවි.
    5. වඩිග පටුන සහ මරු සන්නිය. (............)



A



B

19. ඉහත A හා B රූපවලින් දැක්වෙන්නේ,
    1. අයිලය සහ රටයකුම් වීදිය යි.
    2. රටයකුම වීදිය සහ සන්නිනියකුන් වීදිය යි.
    3. මහසොහොන් වීදිය හා රටයකුම් වීදිය යි.
    4. මහසොහොන් වීදිය සහ රටයකුන් වීදිය යි.
    5. පිල්ලු වීදිය සහ කත්තිරික්කය යි. (............)

20. ''ගත් දිත් තත් දොම් තකු දොං ........'' මෙම පද කොටස අයත් නර්තනාංගය වන්නේ,
    1. ගිරිදේවී නර්තනාංගයයි. 2. මංගලම් නර්තනයයි. 3. ශුද්ධ මාත්‍රයයි.
    4. මුල් මාත්‍රයයි. 5. දෙවොල් පදයයි (............)

21. ''බෝ කොට මඩුවක් බිම පේ කරතී .......'' ඇතුළත් ශාන්තිකර්මය වන්නේ,
    1. කොහොඹා කංකාරි ශාන්තිකර්මය 2. රට යකුම ශාන්තිකර්මය
    3. බලි ශාන්තිකර්මය 4. කිරි මඩුව ශාන්තිකර්මය
    5. වලියක් මංගල්‍යය ශාන්තිකර්මය (............)

22. භරත සහ මණිපුරි නර්තන සම්ප්‍රදායන්ට යොදා ගන්නා වාද්‍ය භාණ්ඩ පිළිවෙලින්,
    1. වීනාව හා පෙනාව යි. 2. වයලීනය හා සාරංගි යි.
    3. වීනාව හා පුංග් බෙරය යි. 4. පෙනා හා වයලීනය යි.
    5. වයලීනය හා මෘදංගය යි. (............)

23. අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයට සෞන්දර්ය විෂය අනිවාර්ය වූයේ,
    1. 1985 2. 1943 3. 1936 4. 1978 5. 1972
    (............)

24. ''ලකල පුළුලු කුල බඳ මිණි මෙවුල්ලා......'' මෙම කවිය අයත් යුගය සහ සන්දේශය වන්නේ,
    1. කෝට්ටේ යුගය - කෝකිල සංදේශය 2. ගම්පොල යුගය - මයුර සංදේශය
    3. කෝට්ටේ යුගය - පරෙවි සංදේශය 4. කෝට්ටේ යුගය - සැළලිහිණි සංදේශය
    5. ගම්පොල යුගය - තිසර සංදේශය (............)

25. රතුවන් දම් ද්විතියික වර්ණය සඳහා අවශ්‍ය මූලික වර්ණ වන්නේ,
    1. නිල් සහ කොළ ය. 2. නිල් සහ කහ ය. 3. රතු සහ නිල් ය.
    4. කොළ සහ රතු ය. 5. කහ සහ කොළ ය. (............)

* අංක **26** සිට **35** තෙක් ප්‍රශ්වලට අදාළ පිළිතුරු යොදා හිස්තැන් පුරවන්න.

26. බෙර පදයක අයත් මාත්‍රා සංඛ්‍යාව ............................................... ලෙසද හැඳින්විය හැකිය.
27. බ්‍රිතාන්‍යයට බැලේ නර්තන කලාව ............................................... සියවස අග භාගයේදී අවතීර්ණ වී ඇත.
28. ඨුම්රි, තරානා යන නර්තනන අංග ............................................... නර්තන සම්ප්‍රදායට අයත් වේ.
29. රීරියකාගේ චරිත නිරූපණයේදී ............................................... වර්ණයෙන් යුත් වස්ත්‍ර භාවිතා කරණු ලබයි.
30. තිල්ලානා නර්තන අංගය භරත නාට්‍ය සම්ප්‍රදායට හඳුන්වා දුන්නේ ............................................... විසිනි.
31. ශ්‍රී ලාංකේය වේදිකා පසුතල නිර්මාණකරනයේ දැවැන්ත චරිතයක් ලෙස ............................................... මහතා හැඳින්විය හැකිය.
32. අභිනවයෙන් බිහි වූ ප්‍රථම එලිමහන් රංග භූමිය ලෙස ............................................... රඟහල හැඳින්විය හැකිය.
33. පටාචාරා කලා කෘතිය නිර්මාණය කරන ලද්දේ ............................................... වර්ෂයේදී ය.
34. උඩැක්කි වරපට සඳහා ............................................... යොදා ගනී.
35. මලකඩ රෝගය, කොක්කනාව යන ලෙඩ රෝග පිළිබඳ සඳහන් වන්නේ ............................................... යක්කමේදී ය.

* අංක 36 සිට 50 තෙක් ප්‍රශ්නවලට අදාල පිළිතුරු තිත් ඉරි මත ලියන්න.

36. ''සිද්ධ මුනිඳු වැඩ හිඳ බෝ මුල විදුරාසන.....'' මෙහි ලඝු සහ ගුරු මාත්‍රා ගණන දක්වන්න.

(i) ලඝු මාත්‍රා ...............................................

(ii) ගුරු මාත්‍රා ...............................................

37. රබීන්ද්‍රනාත් තාගෝර් හා වල්ලතෝල් නාරායන මෙනන් පුරෝගාමී වූ නර්තන සම්ප්‍රදායන් දෙක දක්වන්න.

(i) රබීද්‍රනාත් තාගෝර් ...............................................

(ii) වල්ලටතෝල් නාරායන මෙනන් ...............................................

38. බණ්ඩී බෙරය හා පොකුරු බෙරය නමින් හඳුන්වන වාද්‍ය භාණ්ඩ දෙක නම් කරන්න.

(i) බණ්ඩි බෙරය ...............................................

(ii) පොකුරු බෙරය ...............................................

39. කුල්ලේපිදේනිය හා ශ්‍රියා කාන්තාව මල් බුලත් තටුවට වැඩම කරවීම යන චාරිත්‍ර දක්නට ලැබෙන ශාන්ති කර්ම දෙක නම් කරන්න.

(i) කුල්ලේපිදේනිය ...............................................

(ii) ශ්‍රියා කාන්තාව මල් බුලත් තටුවට වැඩම කරවීම ...............................................

40. විෂ්මය ජනකය බව හා අද්භූත බව දැනවීම සඳහා භාවිත පහන් විශේෂ හා ක්ෂණිකව නිවිනිවි දැල්වෙන පහන් විශේෂ හඳුන්වන නම් දෙක සඳහන් කරන්න

(i) විෂ්මය ජනක බව ...............................................

(ii) ක්ෂණිකව නිවි නිවි දැල්වෙන ...............................................

41. දෙවන පරාක්‍රමබාහු රජු විසින් රචිත ග්‍රන්ථය සහ ඔහුගේ දින චර්යාව සඳහන් ග්‍රන්ථය සඳහන් කරන්න.

(i) ඔහු විසින් රචිත ග්‍රන්ථය ...............................................

(ii) දින චර්යාව පිළිබඳ සඳහන් ග්‍රන්ථය ...............................................

42. ''උගෙ කාරිය ඌ පැල පොල් වනසනවා .....''

මෙම කවිය ඇතුළත් පෙළපාලිය හා ශාන්තිකර්මය නම් කරන්න.

(i) පෙළපාලිය ...............................................

(ii) ශාන්තිකර්මය ...............................................



A



B

43. ඉහත A හා B රූපවලින් දැක්වෙන නාට්‍යමය අවස්ථා දෙක නම් කරන්න.

(i) A ...............................................

(ii) B ...............................................

44. කථක් නර්තනයේ ප්‍රධාන අවනද්ධ භාණ්ඩයෙහි කොටස් දෙක නම් කරන්න.

(i) ..........................................................................................

(ii) ..........................................................................................

45. නිදි කුමාරිය හා හංසවිල බැලේ නාට්‍ය ප්‍රථමවරට වේදිකා ගතවූ වර්ෂ නම් කරන්න.

(i) නිදි කුමරිය ...............................................

(ii) හංසවිල ...............................................

46. හොරණ ශ්‍රී පාලි ආයතනය බිහිවූ වර්ෂය හා ජාතික නැටුම් හා සංගීත විභාගය ව්‍යාප්ත වූ වර්ෂය නම් කරන්න.

(i) ශ්‍රී පාලි ආයතනය ...............................................

(ii) ජාතික නැටුම් හා සංගීත විභාගය ...............................................



A



B

47. A හා B රූපයෙහි දැක්වෙන හිස් පළඳනා නම් කරන්න.

(i) A ...............................................

(ii) B ...............................................

48. ''රළලා උපුලා ලෙලුම තුලා යා .....'' මෙම කවිය අයත් සංදේශ කාව්‍ය හා යුගය නම් කරන්න.

(i) සංදේශය ...............................................

(ii) යුගය ...............................................

49. තිස් තුන් වන සින්දු වන්නම හා එය නිර්මාණය කළ මහාචාර්යය තුමා වන්නේ,

(i) වන්නම ...............................................

(ii) මහාචාර්යය තුමා ...............................................

50. ''පෙරසිට පැවත එන සිරිතට පොදිය බැඳගෙන......'' යනුවෙන් සභාවට පිවිසෙන චරිතය සහ ගැමි නාටකය සඳහන් කරන්න.

(i) චරිතය ...............................................

(ii) ගැමි නාටකය ...............................................

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

**පෙරහුරු පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2022**
**Practice Test - Grade 13 - 2022**

**නර්තනය II** **52 S II**

කාලය: පැය තුනයි

**අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි.**

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය ලබාදෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න**

උපදෙස් :-

* මෙම ප්‍රශ්න පත්‍රය **I, II** හා **III** වශයෙන් කොටස් **තුනකින්** සමන්විත වේ.
* **I** කොටසේ 1 හා 2 ප්‍රශ්න අනිවාර්යය වේ.
* **II** හා **III** කොටස් වලින් අවම වශයෙන් **එක්** ප්‍රශ්නය බැගින් හෝ තෝරාගෙන, අනිවර්යය ප්‍රශ්න දෙක ද ඇතුළුව ප්‍රශ්න **පහකට** පිළිතුරු සැපයිය යුතුය.
* සෑම ප්‍රශ්නයක ම **(i)** කොටසට ලකුණු **06** ක් ද **(ii)** කොටසට ලකුණු **06** ක් ද, **(iii)** කොටසට ලකුණු **08** ක් ද, වශයෙන් මුළු ලකුණු **20** ක් බැගින් හිමි වේ.

## I කොටස

පහත සඳහන් බෙර පද අතුරින් ඔබ උගත් සම්ප්‍රදායට අයත් බෙර පදය තෝරාගෙන ප්‍රස්තාර කරන්න.

01. (i) දොං තකු දොං ජිංතක තරිකිට
දොම් තත් දිතගත ගදිතකු දොම් ගත - ජිමිත් තක්කිට තකට ජිමිතකු
(ii) පහත සඳහන් කවි පද මාත්‍රා තුනේ තාල රූපයට ප්‍රස්තාර කරන්න.
''රන්විල රිද්දිවිල කෙලිනා බිසවුන්ට - මැණික් විලේ දිය නාලා ගොඩ වෙන්ට''
(iii) මයුරා වන්නමේ අඩව්ව ප්‍රස්තාර කරන්න.

02. දේශීය නර්තන කලාවේ ඓතිහාසික තොරතුරු විමසීමේදී එහි ප්‍රගමනයට විවිධ වූ මූලාශ්‍ර හේතු වී ඇත.
(i) අනුරාධපුර යුගයේ නර්තන කලාවේ පෝෂණයට බෞද්ධ ආගමික පුද පූජා වලින් ලැබුණු දායකත්වය සාධක දෙකකින් පෙන්වා දෙන්න.
(ii) උඩරට නර්තන කලාවේ ස්වර්ණමය අවධිය ලෙස සැලකෙන්නේ මහනුවර යුගයයි. දේශීය නැටුමට රාජ්‍ය අනුග්‍රහය ලැබුණු ආකාරය සාධක දෙකක් ඇසුරෙන් විස්තර කරන්න.
(iii) 1980 දශකයෙන් පසු ශ්‍රී ලාංකේය නර්තන කලාවේ පෝෂණයට අධ්‍යාපනික ප්‍රවණතා බලපෑ ආකාරය කරුණු හතරක් ඇසුරෙන් පැහැදිලි කරන්න.

## II කොටස

03. ශාන්තිකර්ම වලදී සාම්ප්‍රදායික නර්තන වල ලක්ෂණ විවිධතා සමානතා මෙන්ම සමාජ සම්බන්ධතා ද මැනවින් විද්‍යාමාන වේ.
(i) වළියකුම ශාන්තිකර්මයේ ආරම්භය පිළිබඳ විග්‍රහයක් කරන්න.
(ii) බලි ශාන්ති කර්මය පැවැත්වීමේ අරමුණු පැහැදිලි කර එහි ගායනා වල සුවිශේෂතා පිරික්සන්න
(iii) සමාජ සම්බන්ධතා හා සාරධර්ම එදිනෙදා ජීවිත හා බැඳෙන ආකාරය කිරිමඩුව ශාන්තිකර්මය ඇසුරෙන් පැහැදිලි කරන්න.

04. සැම ශාන්ති කර්මයකදීම උපත් කතා, රංග වස්ත්‍රාභරණ නට්‍යමය පෙළපාලි හා සැරසිලි වලට විශේෂත්වයක් හිමිවේ.

(i) රට යකුමේ නානු මුරයේ චරිත නිරූපනය යෙදෙන ආකාරය බෙර පද හා කවි පද ඇසුරෙන් විස්තර කරන්න.

(ii) සන්නියකුම ශාන්ති කර්මයේ පුරාවෘත්ත කතා මගින් හෙළිවන බෞද්ධ ආගමික පසුබිම හා සමාජ විශ්වාසය පිළිබඳ විග්‍රහයක් කරන්න.

(iii) පොත්කඩේ යක්කම චරිත නිරූපණයේ දී භාවිත වාචික අභිනය, රංග වස්ත්‍රාභරණ හා රංග උපකරණ පිළිබඳ විමසුමක් කරන්න.

05. දේශිය ගැමි නැටුම් හා ගැමි නාටක ජනතාවගේ ජීවන තොරතුරු විදහාපාන කලා මාධ්‍ය දෙකකි.

(i) ජීවන වෘත්තීන් පදනම් කරගත් ගැමි නැටුම් දෙකක් නම් කර, ඒ තුළින් ප්‍රතීයමාන වන ජීවන රටාව විග්‍රහ කරන්න.

(ii) ගැමි නාටකයක් හා ගැමි නැටුමක් වෙන්කොට හඳුනාගත හැකි අනන්‍යතා ලක්‍ෂන තුනක් විස්තර කරන්න.

(iii) සොකරි වූ කලී සමාජ විෂමතාවයන් රැසක් මනාව විවරණය කෙරෙන උඩරට සිංහල ගැමි නාටකයකි. සනාථ කරන්න.

## III කොටස

06. පහත සඳහන් වගුවෙහි (අ), (ආ) සහ (ඉ) යන කොටස් වලට අදාළව සකසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| (අ) කොටස | (ආ) කොටස | (ඉ) කොටස |
|---|---|---|
| තබ්ලාව | බැරිසිල් | හංස විල |
| චෙන්ඩාව | සාකුන්තලය | නට් ක්‍රැකර් |
| කෝල් බෙරය | කල්පනා | නිදි කුමරිය |
| මෘදංගය | නල දමයන්ති | ගිසෙල්ලි |

(අ) කොටස :- භරත නර්තන සම්ප්‍රදායට අයත් ප්‍රධාන අවනද්ධ භාණ්ඩය තෝරා ගෙන ඒ පිළිබඳ විස්තර කරන්න.

(ආ) කොටස :- කැමති මුද්‍රා නාට්‍යයක් තෝරාගෙන, එහි කතා පුවත, සංගීත නිර්මාණය හා රංග වින්‍යාසය පිළිබඳ විමසීමක් කරන්න.

(ඉ) කොටස :- ''ක්ලාරා සහ ෆිරිට්ස්'' හා බැඳී බටහිර බැලේ නාට්‍ය නම් කර, එම කෘතිය පිළිබඳ විමසුමක් කරන්න.

07. අද්‍යතන නර්තන නිර්මාණයේදී පෙරදිග හා අපරදිග නර්තන ශෛලීන්ගේ ආභාෂය ලබා ඇති බව ප්‍රතීයමාන වේ.

(i) අද්‍යතන නර්තන නිර්මාණවල ඖචිත්‍යය බව ඉහත පාඨය ඇසුරෙන් විස්තර කරන්න

(ii) අද්‍යතන නර්තන නිර්මාණවල ප්‍රාසාංගික බව තීව්‍ර කිරීමෙහිලා තාක්‍ෂණික මෙවලම්, ශිල්පක්‍රම භාවිතයේ ඇති වැදගත්කම පිළිබඳ ඔබේ අදහස් දක්වන්න.

(iii) ප්‍රාසාංගික නර්තන අංග කෙරෙහි සමාජ රුචිකත්වය ලබා ගැනීම සඳහා ''රූපවාහිනිය'' දක්වන දායකත්වය පිළිබඳ ඇගයීමක් කරන්න.

08. ප්‍රාසාංගික නර්තන නිර්මාණ සඳහා අනුෂාංගික කලා බෙහෙවින් උපකාරී වේ.

(i) නර්තන නිර්මාණයක ප්‍රාසාංගික බව තීව්‍ර කිරීමෙහිලා සංගීත කලාවෙන් ලැබෙන පිටුවහල විස්තර කරන්න.

(ii) වෙස් මොස්තර රචනයේ දී හමුවන ප්‍රධාන කොටස් දෙක නම් කර ඉන් එක් අංගයක් පිළිබඳ ඇගයීමක් කරන්න

(iii) ශාන්ති කර්ම හා නූතන වේදිකාව ඇසුරින් ''වේදිකා ආලෝකකරණය'' පිළිබඳ විග්‍රහයක් කරන්න.